අමාත්‍යාංශ චක්‍රලේඛ : 06/2021

මගේ අංකය: SMRIP/ES/01/06/අභ්‍යන්තර චක්‍රලේඛ
වේවැල්, පිත්තල, මැටි, ලී බඩු, සහ ග්‍රාමීය කර්මාන්ත
ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
07 වන මහල, බටහිර කුළුන,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය,
කොළඹ 01.

2021.06.28

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
සියළුම දිස්ත්‍රික් විද්‍යා නිලධාරීන්,
සියළුම මධ්‍යස්ථාන භාර විද්‍යා හා තාක්ෂණ නිලධාරීන්,

**එක් ග්‍රාම නිලධාරී වසමකට එක් ග්‍රාමීය කර්මාන්ත ව්‍යවසායකයෙක් බිහි කිරීමේ වැඩසටහන පුහුණු වැඩසටහන් පැවැත්වීම**

2021.02.25 දිනැති අමාත්‍යාංශ චක්‍රලේඛ 03/2021 සහ එහි සංශෝධනය වන අමාත්‍යාංශ චක්‍රලේඛ 03/2021 (i) යටතේ තෝරාගනු ලබන ප්‍රතිලාභීන් කර්මාන්ත ව්‍යවසායක් ආරම්භ කිරීමට සුදුසු මට්ටමට ගෙන ඒම සඳහා ව්‍යවසායකත්ව සංවර්ධනය සහ ප්‍රායෝගික පුහුණු ලබාදිය යුතු වේ. ඒ සඳහා සකස් කරන ලද පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශ මාලාව (ඇමුණුම 01), මූලික පුහුණු සැලැස්ම (ඇමුණුම 02) සහ ව්‍යාපෘති යෝජනා පත්‍රය සැකසීම සඳහා මාර්ගෝපදේශය (ඇමුණුම 03) මේ සමග ඉදිරිපත් කරමි. ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරන ලෙස කාරුණිකව දන්වමි.

**එම්.ඒ.බී.වී. බණ්ඩාරනායක,**
ලේකම්,
වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය.

පිටපත් :-

1) ජනාධිපති ලේකම්
2) අග්‍රාමාත්‍ය ලේකම්
3) ලේකම්, මුදල් අමාත්‍යාංශය
4) ලේකම්, කර්මාන්ත අමාත්‍යාංශය
5) ලේකම්, තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය
6) සියලුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරු
7) සියළුම ප්‍රාදේශීය සංවර්ධන කමිටු සභාපතිවරුන්
8) ලේකම්, අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය
9) ලේකම්, ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාව තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය
10) විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව
11) අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව
12) අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
13) අධ්‍යක්ෂ ජනරාල්, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව
14) අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
15) අධ්‍යක්ෂ, කුඩා ව්‍යවසාය සංවර්ධන අංශය, තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය
16) සභාපති, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

**එක් ග්‍රාම නිලධාරී වසමකට එක් ග්‍රාමීය කර්මාන්ත ව්‍යවසයකයෙක් බිහි කිරීමේ වැඩසටහන - පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශ**

01. මෙම වැඩසටහන යටතේ න්‍යායාත්මක පුහුණු වැඩසටහන් ප්‍රාදේශීය වශයෙන් සිටින සම්පත් දායකත්වයෙන් හා අවශ්‍ය වන්නේ නම්, වෙනත් සම්පත් දායකයන්ගේ දායකත්වයෙන් ඉටුකරගැනීමටත්, ප්‍රායෝගික පුහුණුව ප්‍රාදේශීය වශයෙන් හා අවශ්‍ය වන්නේ නම් ආයතනික වශයෙන් පැවැත්වීමටත් සාමාන්‍ය තත්වය යටතේ සැලසුම් කර තිබුණි.

නමුත් වර්ථමාන කොවිඩ් 19 වසංගත තත්වය යටතේ ජනතාව ඒකරාශි කිරීම අත්හිටුවීම හා සංචරණ සීමාවන් පැනවීම වැනි ක්‍රියාමාර්ගයන් නිසා සාමාන්‍ය පරිදි පුහුණු වැඩසටහන් පැවැත්වීමේ හැකියාවක් නොමැත. එබැවින් මෙම පුහුණු වැඩසටහන් ඉදිරියට ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු විකල්ප ක්‍රමවේදයන් අනුගමනය කළයුතු බව කාරුණිකව පෙන්වා දෙමි.

02. කර්මාන්ත ව්‍යාපාරයක් ආරම්භ කිරීමට කැමැත්තක් දක්වන පුද්ගලයින් තෝරා ගැනීමෙන් පසු, එම කර්මාන්තය ආරම්භ කිරීමට සුදුසු තත්වයට ගෙන ඒම සඳහා න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණු ලබා දිය යුතු වේ.ඒ සඳහා සකස් කල මූලික පුහුණු සැලැස්මේ පිටපතක් මේ සමග අමුණා ඇත. (අදාළ පරිදි සංශෝධනය කරගත හැකි වේ)

03. න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණු වැඩසටහන් සම්පූර්ණ වන විට තෝරාගත් කර්මාන්ත ව්‍යවසායකයින් කර්මාන්තයක් සාර්ථකව ආරම්භ කර, ක්‍රියාත්මක කිරීමේ හැකියාව පිළිබඳ මූලික දැනුම හා පුහුණුව ලබා තිබිය යුතුය. මෙහිදී විශේෂයෙන් ව්‍යවසායකත්වයේ වර්ධනයට බලපාන සාධක, ව්‍යාපාර ආචාරධර්ම, සාර්ථක ව්‍යසායකයෙකු සඳහා අවශ්‍ය කුසලතා, අභිප්‍රේරණය සහ නායකත්වය, ව්‍යවසායකත්ව අවස්ථා හඳුනාගැනීම, ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම, අලෙවිකරණ උපායමාර්ග, ව්‍යාපාර ඉදිරියට අඛණ්ඩව පවත්වා ගැනීමට මූල්‍ය කළමණාකරණය සහ මූල්‍ය විනය, ව්‍යාපෘති යෝජනා පත්‍රය සකස් කිරීම ආදිය පිළිබඳව නිවැරදි හා මනා අවබෝධයක් ලබා ගත යුතුය.

04. සාමාන්‍ය ක්‍රමවේදයන්ට අනුව පුහුණු වැඩසටහන් ආරම්භ කරන තෙක් පහත සඳහන් විකල්ප ක්‍රමවේදයන් මගින් පුහුණුව ලබාදීම ක්‍රියාත්මක කරනු ලැබේ.

(i) මාර්ගගත ක්‍රම (Online)- Zoom, Microsoft Teams
(ii) වීඩියෝ තාක්ෂණ ක්‍රම - YouTube

මෙහිදී අන්තර්ජාල පහසුකම් හෝ අවශ්‍ය විද්‍යුත් උපාංග නොමැති පුහුණුලාභීන්ට සුදුසු පරිදි විකල්ප ක්‍රමවේදයන් මගින් පුහුණුව ලබාදීමට පහසුකම් සැලසිය යුතු වේ.

05. මූලික පුහුණු සැලැස්මේ පුහුණු වැඩසටහන් ජාතික මට්ටමේ සම්පත් දායකත්වයෙන් සූම් තාක්ෂණය, පටිගත කල වීඩියෝ පට හුවමාරුව, අමාත්‍යාංශයේ යූටියුබ් නාලිකාව වැනි තාක්ෂණික ක්‍රම භාවිතා කිරීමෙන් අදළ පහසුකම් අමාත්‍යාංශය විසින් ලබා දීමට කටයුතු කරනු ලැබේ. ඊට අමතරව මෙම පුහුණු වැඩසටහන සඳහා සම්බන්ධ කරගත හැකි සුදුසු සම්පත් දායකයින් ප්‍රාදේශීයව සිටිනම් ඒ පිළිබඳ විස්තර ලබා දීමට කටයුතු කල හැකිය.

මෙයට අමතරව දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය වශයෙන් සිටින සම්පත් දායකයින් උපයෝගී කරගෙන කළ හැකි පුහුණු වැඩසටහන් ඔබ විසින්ද සංවිධානය කර ගැනීමට බාධාවක් නොමැත. ඒ සඳහා රජයේ අනුමත සම්පත්දායක දීමනා ගෙවිය හැකිවේ.

06. ප්‍රායෝගික මූලික පුහුණුව විද්‍යා හා තාක්ෂණ නිලධාරීන් විසින් ලබා දීමට අපේක්ෂා කරන අතර අමාත්‍යාංශය විසින්ද ප්‍රධාන සම්පත් දයකින් මගින් පටිගත කරන ලද පුහුණු වැඩසටහන් ලබා දීමට කටයුතු කරනු ලැබේ. ඊට අමතරව ආයතනික පුහුණුව අවශ්‍ය ව්‍යවසයකයින්හට පුහුණුව ලබා දීම දිස්ත්‍රික් විද්‍යා නිලධාරීන්ගේ සම්බන්ධීකරණයෙන් අමාත්‍යංශය විසින් ඉටු කරනු ලැබේ.

තාක්ෂණ පැවරීම් පුහුණු වැඩසටහන් පැවත්වීමේදී එකම විෂය පථයට අදාළව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල සීමිත ප්‍රතිලාභීන් ප්‍රමාණයක් සිටිනම් කොට්ඨාශ කිහිපයෙහි ව්‍යවසයකයින් කණ්ඩායමක් වශයෙන් පුහුණු කිරීම දිස්ත්‍රික් විද්‍යා නිලධාරී විසින් සිදුකල යුතුය. එම අවස්ථාවේදී දිස්ත්‍රික් විද්‍යා නිලධාරී විසින් එම පුහුණු වැඩසටහනට අදාළ වියදම් ඇස්තමේන්තුව සකස් කර, අමාත්‍යංශයට ඉදිරිපත් කල යුතුය. අමාත්‍යංශය විසින් මෙම ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් වෙත නිදහස් කරනු ලැබේ.

07. යෝජිත ක්‍රමවේදය අනුව පුහුණු වැඩසටහන් වල මූලික ප්‍රධාන වියදම් අමාත්‍යාංශය විසින් දරනු ලබන බැවින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් වෙන් කර ඇති ප්‍රතිපාදන සම්පූර්ණයෙන් වියදම් කිරීම අපේක්ෂා කරනු නොලැබේ.

08. පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා නව තාක්ෂණික ක්‍රම ප්‍රථමයෙන් උපයෝගී කරගනු ලබන බැවින් එහිදී ඇති වන අභියෝගයන් ජය ගැනීම සඳහා සියළුදෙනාගේ සහයෝගය සහ කැපවීම අවශ්‍ය බව සිහිපත් කරන අතර, ඒ සඳහා විද්‍යා අංශයේ සහකාර අධ්‍යක්ෂ, ජයසමරා ගුණරත්න මෙය (දුරකථන අංක 011 2331356 / 011 7574221) සමඟ නිරන්තර සන්නිවේදනයක් සකස් කර ගැනීම සුදුසු වේ.

ඇමුණුම - 02

# මූලික පුහුණු සැලැස්ම

1. ව්‍යවසායකයා සහ ව්‍යවසායකත්වය

- ව්‍යවසායකත්වය යනු කුමක්ද?
- ව්‍යවසායකයෙකු යනු කවුද?
- ව්‍යවසායකත්වයේ වර්ධනයට බලපාන සාධක
- ව්‍යාපාර ආචාරධර්ම
- සාර්ථක ව්‍යසායකයෙකු සඳහා අවශ්‍ය කුසලතා, අභිප්‍රේරණය සහ නායකත්වය, පෞරුෂත්ව ශෛලීන් සහ චර්යා රටාවන්

2. පුද්ගලික හා ව්‍යවසායකත්ව අරමුණු සැකසීම හා නායකත්වය වර්ධනය කිරීමේ පියවර

- පුද්ගලික ශක්තීන් හා දුර්වලතා හඳුනාගැනීම
- ධනාත්මක ආකල්පය
- අන් අය දැනීම, හඳුනාගැනීම හා සංවේදනයෙන් යුතුව කටයුතු කිරීමේ හැකියාව
- චිත්තවේගාත්මක බුද්ධිය මඟින් ධනාත්මක අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩනැගීමේ හැකියාව
- ව්‍යාපාරයට ගැලපෙන පරිදි ඉහළ කාර්ය සාධන නායකත්වය, කණ්ඩායම්ගත එලදායිතාව හා කණ්ඩායම් සහයෝගීතාවය

3. දුෂ්කර අවස්ථාවන්හිදී ප්‍රතිචාර දැක්වීම, අභියෝග හමුවේ නොසැලීසිටීම, ආතතිය පාලනය කිරීම සඳහා උපාය මාර්ග

❖ ව්‍යවසායකත්ව අවස්ථා හඳුනාගැනීම

- ව්‍යාපාර ආකෘති
- සාර්ථක ව්‍යාපාර අදහසක් සොයා ගන්නේ කෙසේද ?
- අවහිරතා අවබෝධ කරගැනීම (තනි සීමාවන්, කණ්ඩායම් අවහිරතා, ආයතනික අවහිරතා, කර්මාන්ත සහ වෙළඳපල සීමාවන්,ආර්ථික බාධක ,දේශපාලනික බාධක, සමාජීයබාධක, තාක්ෂණික අවහිරතා හා පාරිසරික බාධක)

4. ව්‍යාපාරයේ උපායමාර්ග නිර්මාණය කිරීම

- ගනුදෙනුකරුවන් හඳුනාගැනීම
- වෙළඳපල අවශ්‍යතා හා කර්මාන්තය අවබෝධ කරගැනීම
- තරඟකාරී වාසිය
- ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම
- වෙළඳපොලේ ස්ථානගත කිරීම
- අලෙවිකරණ උපාය මාර්ග - භාණ්ඩය, මිල, ස්ථානය හා ප්‍රවර්ධන ක්‍රම
- පාරිභෝගික සම්බන්ධතා සහ සන්නිවේදනය
- ව්‍යවසායකත්ව සඳහා අන්තර්ජාලය යොදගැනීම

5. ගනුදෙනුකරුවන් සමඟ සන්නිවේදනය කිරීම

- අනාගත ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීම
- ගනුදෙනුකරුවන් රඳවාගැනීම
- පාරිභෝගික තෘප්තිය
- පාරිභෝගික සත්කාර

❖ මානව සම්පත් සංවර්ධන සැලැස්ම

- මානව සම්පත් ප්‍රතිපත්ති සහ වැඩසටහන්
- ආයතනික කළමනාකරණය (ව්‍යුහය, විශ්ලේෂණය සහ රැකියා විස්තරය)

6. මූල්‍ය කළමනාකරණය

- මූල්‍ය විනය
- මුදල් පොතක් තබා ගැනීම
- ගිණුම් තැබීම හා වාර්තා
- මූල්‍ය ප්‍රකාශන සැකසීම

7. මෙතෙක් අධ්‍යනය කරණු ලැබූ කරුණු මත ව්‍යාපෘති යෝජනා පත්‍රය සකස් කිරීම

- ඊට අදාල දළ සටහන හා මාර්ගෝපදේශය ලබා දීම

8. ප්‍රයෝගික පුහුණුව

ඇමුණුම - 03

## ව්‍යාපෘති යෝජනා පත්‍රය සැකසීම සඳහා මාර්ගෝපදේශය

ඔබ විසින් යෝජනා කරන ව්‍යාපෘතිය මෙම මාර්ගෝපදේශයේ අනුපිළිවෙලට විස්තර සහිතව සකස් කළ යුතුය.

1. ව්‍යාපෘතියේ පසුබිම

   a. ව්‍යාපෘතියෙන් යෝජනා කරන ව්‍යාපාරය
   b. මෙම ව්‍යාපාරය යෝජනා කිරීමට හේතුව
   c. ව්‍යාපාරය හරහා ලබා දෙන විසඳුම
   d. කෙටිකාලීන ඉලක්ක
   e. දිගුකාලීන ඉලක්ක
   f. ව්‍යාපාරයේ අරමුණ

2. වර්තමාන තත්වය

   a. ශක්තීන්, දුර්වලතා, අභියෝග හා අවස්ථා
   b. ආර්ථික බාධක, දේශපාලනික බාධක, සමාජීය බාධක, තාක්ෂණික අවහිරතා හා පාරිසරික බාධක
   c. වර්තමාන වෙළඳපල අවශ්‍යතා හා තරඟකාරී ව්‍යාපාර
   d. තරඟකාරී වාසිය

3. භාණ්ඩ නිෂ්පාදන සැලැස්ම

   a. සංක්ෂිප්ත නිෂ්පාදන ක්‍රියාවලිය (වායාරූප ඇතුලත් කළ හැකිය)
   b. නිෂ්පාදන සම්පත් හා අමුද්‍රව්‍ය
   c. ව්‍යාපාරයේ පිහිටීම
   d. බුද්ධිමය දේපළ අයිතිය ලබාගෙන ඇත්නම් / ලබාගැනීමට බලාපොරොත්තු වන්නේ නම් ඒ පිළිබඳ සංක්ෂිප්ත විස්තරය.

4. අලෙවිකරණ හා ප්‍රවර්ධනය සැළසුම

   a. ඉලක්ක පාරිභෝගිකයා
   b. ව්‍යාපාරය ස්ථානගත කිරීම
   c. අලෙවිකරණ උපායමාර්ග - භාණ්ඩය, මිල, ස්ථානය හා ප්‍රවර්ධන ක්‍රම
   d. පාරිභෝගික සම්බන්ධතා සහ සන්නිවේදන සැළසුම

5. මානව සම්පත් සංවර්ධන සැලැස්ම

   a. මානව සම්පත් අවශ්‍යතාවය
   b. ආයතනික කළමනාකරණය

6. මූල්‍ය කළමණාකරණය

a. ප්‍රාග්ධන පිරිවැය
b. කාරක ප්‍රාග්ධනය
c. එක් භාණ්ඩයක් සඳහා නිෂ්පාදන පිරිවැය
d. ව්‍යාපෘතියේ සම්පූර්ණ වියදම් ඇස්තමේන්තුව
e. ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය වන අමතර ප්‍රාග්ධනය ප්‍රතිලාභියා විසින් ලබාගන්නේද?
f. එසේ යෙදිය හැකි මුදල
g. රජය හා ප්‍රතිලාභියා දරන ව්‍යාපෘති පිරිවැය ඉක්මවන අවස්ථාවකදී මූල්‍ය පහසුකම් අවශ්‍ය වන්නේ නම් ඒ පිළිබඳ විස්තර

7. හඳුනාගත් ප්‍රතිලාභියා ව්‍යවසායකයෙක් බවට පත් කිරීමට අමාත්‍යාංශයෙන් අවශ්‍ය වන දායකත්වය

(උදා: තාක්ෂණික හා අනෙකුත් පුහුණු අවශ්‍යතා, යන්ත්‍රෝපකරණ අවශ්‍යතා, නිෂ්පාදනවල ගුණාත්මකත්වය ඉහළ නැංවීමට අවශ්‍ය තත්ව පරීක්ෂණ වාර්තා/ ප්‍රමිති සහතික, මූල්‍ය ආයතන සම්බන්ධීකරණය, අලෙවිකරණය, වෙළඳපල සොයා ගැනීම, ව්‍යවසායකත්ව හැකියාව වැඩි දියුණු කිරීම)